**නිමැවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු (GPOBA) ව්‍යාපෘතිය - 2014**

---

නිමැවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු (GPOBA) ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2011 දෙසැම්බර් 27 දින එළඹි අංක ටීඑෆ් 099870 දරන ප්‍රදාන ගිවිසුමේ II (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

නිමැවුම් පදනම් ආධාර මත ගෝලීය හවුල්කරු ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ නාගරික සංවර්ධන, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, පවත්නා නිවාස මලාපවහන සම්බන්ධතා සංඛ්‍යාව හා නව මලාපවහන ජාලයන් වැඩිකිරීම සහ ගෘහස්ථ මට්ටමින් ස්ථානීය සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීම මඟින් මහ කොළඹ ප්‍රදේශයේ අඩු ආදායම් නිවැසියන් සඳහා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමයි. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1132.17 කට සමාන එජඩො මිලියන 9.85 ක් වන අතර ඉන් රු.මිලියන 583.66 කට සමාන එජඩො මිලියන 5.08 ක් හෙවත් සියයට 52 ක් මූල්‍යායනය කිරීම සඳහා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. තවද රු.මිලියන 372.4 කට සමාන එජඩො මිලියන 3.24 ක් හෙවත් සියයට 33 ක් සඳහා ශ්‍රී ලංකා රජය දායක වන අතර රු.මිලියන 126.97 කට සමාන එජඩො මිලියන 1.10 ක් හෙවත් සියයට 11 ක් සඳහා ජාතික ජලසම්පාදන හා ජලපවහන මණ්ඩලය දායක වේ. ඉතිරි රු.මිලියන 49.13 කට සමාන එජඩො මිලියන 0.43 හෙවත් සියයට 4 සඳහා ප්‍රතිලාභීන් දායක වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර 2015 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානයෙන් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමෙ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මතය

----------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

2.2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ සමස්ත කාර්ය මණ්ඩල තත්ත්වය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 08 වගන්තිය අනුව, රු.මිලියන 5 ක් හෝ ඊට වැඩි කොන්ත්‍රාත් භාරගන්නා කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතුය. තවද ටෙන්ඩරය පිරිනැමීමෙන් පසුව දින 60

ක් ඇතුළත ටෙන්ඩර් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. ව්‍යාපෘතියේ කාර්යයන්වල යෙදී ඇති කොන්ත්‍රාත්කරුවන් මෙම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එ ජ ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ ජ ඩො මිලියන | රු.මිලියන | එ ජ ඩො මිලියන | රු.මිලියන |
| ප්‍රදාන | 5.081 | 583.662 | 200.000 | 0.024 | 3.119 | 0.024 | 3.119 |
| ශ්‍රී ලං ර | 3.242 | 372.402 | 165.000 | 1.240 | 161.881 | 1.608 | 209.941 |
| ජා ජ ස ජ ම | 1.105 | 126.977 | 50.000 | 0.383 | 50.000 | 0.498 | 65.000 |
| ප්‍රතිලාභීන් | 0.428 | 49.135 | - | 0.014 | 1.875 | 0.054 | 7.025 |
| එකතුව | 9.856 | 1,132.176 | 415.000 | 1.661 | 216.875 | 2.184 | 285.132 |

විදේශ ප්‍රදාන යටතේ 2014 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සලසන ලද රු.මිලියන 200 ක් වූ මුළු වෙන් කිරීමෙන් රු.මිලියන 35 ක මුදලක් ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන වෙනත් ව්‍යාපෘති සඳහා මාරු කර තිබුණි.

3.2 භෞතික ප්‍රගතිය

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් සංරචක 11 කින් සංරචක 5 ක් මූල්‍ය සීමා කිරීම් හේතුවෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියේ ප්‍රධාන සැලැස්මේ ප්‍රතිලාභී ගෘහ ඒකක 15,407 ක් සඳහා ඉලක්ක කරන ලද ජල සම්පාදන සම්බන්ධතා ආරම්භක අදියරේදී කරන ලද සාවද්‍ය ඇස්තමේන්තු කිරීම හේතුවෙන් පසුව ප්‍රතිලාභී ගෘහ ඒකක 8,800 ක් දක්වා අඩුකර තිබුණි.

(ඇ) දෙහිවල, ගල්කිස්ස, කොලොන්නාව සහ ජාඇල/ ඒකල හා මොරටුව/ රත්මලාන ප්‍රදේශවල සෘජු මලාපවහන සම්බන්ධතා පිළිබඳ කොන්ත්‍රාත්තු 2015 ජනවාරි 17 වන විට නිම කළ යුතු වුවද, රත්මලාන හා මොරටුව අපජලය අපහරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ වැඩවල ප්‍රමාදය හේතුවෙන් ඒ පිළිබඳ සිදුකරන ලද වැඩවල භෞතික ප්‍රගතිය 2014 දෙසැම්බර් 31 දිනට සියයට 71 ක් ලෙස පැවතුණි.

(ඈ) ප්‍රදාන ගිවිසුම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අත්පොතේ විධිවිධාන වලට අනුව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා පූර්ණකාලීන පදනම් මත ව්‍යාපෘතිය සඳහා පත්කළ යුතුය. කෙසේ වුවද 2011 නොවැම්බර් සිට වැඩබැලීමේ පදනම මත ව්‍යාපෘති කළමනාකරුවකු පත්කර තිබුණි.

3.3 මූල්‍ය පාලන පිළිබඳ කරුණු

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 ජූලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘතියේ ගනුදෙනු අභ්‍යන්තර විගණනයකට භාජනය කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියේ දේපල, පිරියත හා උපකරණ පිළිබඳ භෞතික පැවැත්ම පරීක්ෂා කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ එම වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

3.4 මතභේදයට තුඩුදෙන කරුණු

--------------------------------

පරිපාලන කාර්යයන් සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ව්‍යාපෘතිය විසින් බඳවා ගෙන තිබුණද පරිචයක් වශයෙන්, ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සඳහා පාරිශ්‍රමික ගණනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදුකරනු ලබන අතර ඒ සඳහා සියයට 20 ක පොදුකාර්ය ගාස්තු ව්‍යාපෘතියෙන් අයකරනු ලැබේ. සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවන ලද පොදුකාර්ය වියදම් රු.මිලියන 28 ක් විය.